# ආනන්ද විහාර ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය - 2013



## ආනන්ද විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය

**සමග**

# ආදි ආනන්දීය බෞද්ධ සංගමය

**ක්‍රියාත්මක කෙරෙණ ව්‍යාපෘතියකි.**

ආදි ආනන්දීය බෞද්ධ සංගමය
25 සංවත්සරය
1988 - 2013

# පටුන

ආදි ආනන්දීය බෞද්ධ සංගමයේ ආරාධනය.

ආනන්ද විහාරයේ වත්මන් තත්වය ( ඡායාරූප).

විහාර සංරක්ෂණ ව්‍යාපතිය.

- ප්‍රතිසංස්කරණ සහ නවීකරණ කාර්යයන්.
- සැලසුම්
- මූලික ඇස්තමේන්තුව.
- අනුශාසක මණ්ඩලය
- උපදේශක මණ්ඩලය
- ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව.
- තාක්ෂණික කමිටුව.
- අරමුදල් පරිපාලනය.
- ප්‍රතිසංස්කරණ සහ නවීකරණ කටයුතු පැවරීම.
- ව්‍යාපෘතිය සම්බන්ධව විස්තර ලබා ගැනීමට
- ඉලක්කගත කාලය.

ආනන්ද විහාර වංශ කථාව.

ආදි ආනන්දීය බෞද්ධ සංගමයේ සේවාවන්

ලොව සර්වඥ ධාතූන් වහන්සේ තැන්පත් කොට පවතින
දර්ශනීය වූ දුර්ලභ බුද්ධ ප්‍රතිමාවන්ගෙන් එකක් ලෙස සුදෝ සුදින් දිදුළන
සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේ ප්‍රතිෂ්ඨාපිතව,
බරණැස ඉසිපතන මිගදායේ සාරානාත්හි මූලගන්ධකුටි විහාර මන්දිරයේ ආකෘතියකට අනුරූපව ඉදි කොට
වත්මනයේ ආනන්දයේ උතුම් සංකේතය බවට මූර්තිමත් වූ

# ආනන්ද විහාර මන්දිරය

වසර ගනනාවක සිට ආදි ආනන්දීය බෞද්ධ සංගමය මගින් රැක බලා ගනු ලබන්නේ ඉමහත් භක්තියෙනි.
ආදි ආනන්දීය බෞද්ධ සංගමය මගින් වරින් වර විහාර මන්දිරයේ
**පිටත කොටස** මුදලින් ලක්ෂ 50කට අධික මුදලක් වැය කොට ප්‍රතිසංස්කරණය කළද
විහාර මන්දිරයේ **ඇතුළත කොටසේ කොන්ක්‍රීට් තට්ටුව**
2013 මුල් කාලයේ සිට අනුක්‍රමයෙන් කඩා වැටීමේ තර්ජනයකට මුහුණපා සිටිමු.
විශේෂයෙන්ම කොන්ක්‍රීට් තට්ටුව වැර ගැන්වීම සඳහා යොදා ඇති යකඩ දිරාපත්ව ගොස් ඉතාමත් අවදානම්
තත්වයක පවතින මොහොතකමැනවින් පරීක්ෂා කිරීමේදී
ඉතාමත් කඩිනම් ප්‍රතිසංස්කරණ කටයුත්තක අවශ්‍යතාව අප අවබෝධ කර ගතිමු.
අපගේ ඒ උතුම් සඳහම් සංකේතය, චිරකාලීන පැවැත්මට බලවත් අර්බුදයකට හා අනතුරකට පත්ව ඇති
කනගාටුදායක මේ අවස්ථාවේ එම ප්‍රශ්න වලට පිළියම් කිරීමේ වැදගත් උතුම් කටයුත්ත
ඔබටද පැහැදිලි කරදීමට සහ එයට සහභාගීකරවා ගැනීමටද අපි තීරණය කළෙමු.
වසර විසිපහක අභිමානවත් අතීතයක් ඇති ආදි ආනන්දීය බෞද්ධ සංගමය
මෙම කාර්යය මෙහෙයවුමට ඉතාමත් සතුටින් ඉදිරිපත් වන්නට තීරණය කර ඇත.
මේ කාර්යය සාර්ථක කරගැනීම සඳහා
ආනන්ද විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ පූර්ණ අනුග්‍රහය සහ සහයෝගයත්
ආනන්ද විද්‍යාලයීය සියළුම ආදි ශිෂ්‍ය අනුබද්ධ ශාඛා,
ආදි ආනන්දීයන්,
වත්මන් ආනන්දීයන්,
වත්මන් සහ ආදි ගුරු භවතුන්,
මෙන්ම ආනන්දයට හිතැති සැමගේ
සහය සහ ආධාරය අපි බලාපොරොත්තු වෙමු.
ඉතාමත් විවෘත එමෙන්ම විනිවිද භාවයෙන් යුක්තව වසර විසිපහක් (25 )
අප සංගමයේ මූල්‍යමය කටයුතු සිදුකර ඇති බැවින් මෙම වාර්ථාවේ අවසානයේ දක්වා ඇති
ආකාරයේ විශාල වැඩ කොටසක් අප සංගමයට සිදු කිරීමට හැකි විය.
මෙම කාර්යය ද ඉතාමත් අවංකව, එමෙන්ම කඩිනමින් නිමකරගැනීමට
ඔබ සැමගේ සහය අපට ලැබෙනු ඇතැයි අප කාරුණිකව ඉල්ලා සිටිමු.
ආනන්දයේ උතුම් වන්දනීය සඳහම් සංකේතය!
ආනන්දයේ අභිමානය!,
ආනන්ද මාතාවගේ හදවත !
ඔබ අප සැම එක්ව රැක ගනිමු!
ආරක්ෂා කර ගනිමු!.

**ඔබ සැමට අනද මාතාවගේ සරණයි!**

- ආදි ආනන්දීය බෞද්ධ සංගමය -

# කඩා වැටුන කොන්ක්‍රීට් තට්ටුව





# කඩා වැටුන කොන්ක්‍රීට් තට්ටුව







# පිළිම වහන්සේ පිටුපස ඇති ඉරී දිරාපත්වූ තිරය



# ප්‍රතිසංස්කරණ සහ නවීකරණ කාර්යයන්

- දැනට දුර්වල තත්වයේ පවතින විහාර මන්දිරයේ ඇතුලත කොන්ක්‍රීට් තට්ටුව සම්පූර්ණයෙන් කඩා ඉවත් කොට නිවැරදි ප්‍රමිතින්ට අනුකූලව සහ අවශ්‍ය වැර ගැන්වීම් සහිතව කොන්ක්‍රීට් තට්ටුව නැවත ගොඩ නැගීම.

- විහාර මන්දිරයේ ඉතිරි අනෙකුත් කොන්ක්‍රීට් කොටස් පිළිසකර කිරීම සහ වහලය මත නිවැරදි වැසි ජලය ප්‍රවාහන ක්‍රමවේදයක් අලුතින් සකස් කිරීම සහ ජල වාරකයකින් සම්පූර්ණ කොන්ක්‍රීට් වහලය ආරක්ෂා කිරීම.

- ආබාධිත අයට ඇතුළුවීමට විහාර මන්දිරයට අගෞරවයක් නොවන පරිදි පිළිගත් ක්‍රම වේදයන්ට අනුකූලව බැවුම් මාර්ගයක් ගොඩනැගීම.

- විහාර මන්දිරය ඇතුළත සහ පිටත විදුලි ආලෝක පද්ධතිය නවීන තාක්ෂණයට අනුව නැවත සකස් කිරීම.

- විහාර මන්දිරයේ ඇතුළත නවීන තාක්ෂණික ක්‍රම වේදයන් සහිතව ශබ්දවාහිනි පද්ධතියක් සවි කිරීම.

- විහාර මන්දිරය ඇතුලත වාතාශ්‍රය පාලනය කිරීම සඳහා ක්‍රම වේදයක් ඇති කිරීම.

- බුද්ධ ප්‍රතිමා වහන්සේ පිටුපස ඇති තිරය නිර්මාණය කිරීම.

- විහාර මන්දිරය ඇතුලත සහ පිටත දේශගුනික තත්වයන් ආවරණය වන ප්‍රමිතීන්ට අනුකූලවන නිර්දේශිත තීන්ත ආලේප කිරීම.

- විහාර මන්දිරය වටා ඇති, විහාර මන්දිරයට විශාල තර්ජනයක් වන ගස් ඉවත්කර ආනන්දයේ අභිමානය රැකෙන පරිදි විහාර මන්දිරය වටා පුෂ්පිත පරිසරයක් සහිතව මැනවින් සකස් කිරීම.

- දැනට නිතර සිදුවන බලවත් හානි වලක්වා ගැනීමට විහාර මන්දිරයේ සහ විදුලි පද්ධතිවල ආරක්ෂාව සඳහා අකුණු සන්නායකයක් සවිකිරීම

# සැලසුම්






1' 6"
1' 3 3/4"
2'
10"
1'


GLASS DOOR
FRONT
12' 6 1/2"
11' 10 1/4"
12' 6 1/2"
16' 7 1/2"
44' 11 1/4"
PLAN

# මූලික ඇස්තමේන්තුව

| | | |
|---|---|---|
| ➢ කොන්ක්‍රීට් තට්ටුව කඩා ඉවත් කොට කොන්ක්‍රීට් තට්ටුව නැවත ගොඩ නැගීම. | රු. | 7,100,000.00 |
| ➢ විහාර මන්දිරයේ අනෙකුත් කොන්ක්‍රිට් කොටස් පිළිසකර කිරීම සහ වහලය මත නිවැරදි වැසි ජලය ප්‍රවාහන ක්‍රමවේදයක් සකස කිරීම. | රු. | 2,700,000.00 |
| ➢ විහාර මන්දිරයට ආබාධිත අය සඳහා ඇතුල්වීමට බෑවුම් මාර්ගයක් ගොඩනැගීම. | රු. | 300,000.00 |
| ➢ විහාර මන්දිරය ඇතුලත සහ පිටත විදුලි ආලෝක පද්ධතිය නැවත සකස් කිරීම. | රු. | 3,500,000.00 |
| ➢ විහාර මන්දිරයේ ඇතුලත නවීන ශබ්දවාහිනි පද්ධතියක් සවි කිරීම. | රු. | 1,000,000.00 |
| ➢ විහාර මන්දිරය ඇතුලත වාතාශ්‍රය පාලනය කිරීම සඳහා ක්‍රම වේදයක් ඇති කිරීම. | රු. | 1,500,000.00 |
| ➢ බුද්ධ ප්‍රතිමා වහන්සේ පිටුපස ඇති තිරය අලුතින් සවිකිරීම. | රු. | 350,000.00 |
| ➢ විහාර මන්දිරය ඇතුලත සහ පිටත දේශගුණික තත්වයන් ආවරණය වන ප්‍රමිතීන්ට අනුකූල වන තීන්ත ආලේප කිරීම | රු. | 1,800,000.00 |
| ➢ විහාර මන්දිරය වටා ඇති පරිසරය නැවත සකස් කිරීම. | රු. | 1,500,000.00 |
| ➢ අකුණු සන්නායකයක් සවිකිරීම. | රු. | 750,000.00 |
| **ඇස්තමේන්තුගත මූලික වියදම** | **රු.** | **20,500,000.00** |

# සංගමයේ අනුශාසක මණ්ඩලය

| | |
|---|---|
| ❖ පූජ්‍ය දිවියාගහ යසස්සී ස්වාමීන් වහන්සේ | ප්‍රධාන අනුශාසක |
| ❖ පූජ්‍ය හබරකඩ ඉන්දරතන ස්වාමීන් වහන්සේ | සහාය ප්‍රධාන අනුශාසක |
| ❖ පූජ්‍ය හඟුරන්කෙත චන්දරතන ස්වාමීන් වහන්සේ | විද්‍යාලයීය බෞද්ධ සංගමයේ ප්‍රධාන අනුශාසක |
| ❖ කිත්සිරි ලියනගමගේ මහතා | ගරු විදුහල්පතිතුමා |
| ❖ ලලිත් සේනානායක මහතා | ආදි ශිෂ්‍ය සංගමයේ ගරු සභාපතිතුමා |
| ❖ මහාචාර්ය අතුල කළුආරච්චි මහතා | |
| ❖ මිහිර පෙරේරා මහතා | |
| ❖ ජගත් සුමතිපාල මහතා | |
| ❖ චන්න පන්සූරිය මහතා | |
| ❖ කර්නල් සුදත් මඩුගල්ල මහතා | |

# සංගමයේ උපදේශක මණ්ඩලය

- සෝමා විජේරත්න මෙනවිය.
- මහාචාර්ය ප්‍රනීත් අබේසුන්දර මහතා
- කුෂිල් ගුණසේකර මහතා
- දයා ගමගේ මහතා
- ශාන්ත කලහෙවත්ත මහතා
- යත්න පෙරේරා මහතා
- සේනක විමලතුංග මහතා
- රුවන් රත්නවීර මහතා
- අරුණ විජේසේකර මහතා
- පානි රන්වල මහතා
- සුමේද අමරසිංහ මහතා
- මහේන්ද්‍ර ජයසිංහ මහතා
- ධනංජය මොහොට්ටි මහතා

# ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව

| | | |
|---|---|---|
| - | චන්න පලන්සූරිය මහතා | ව්‍යාපෘති සභාපති.<br>(ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභික , ආ.ආ. බෞ.ස. ගරු අනුශාසක,) |
| - | මහේන්ද්‍ර ජයසිංහ මහතා | ව්‍යාපෘති ලේකම්.<br>(ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභික , ආ.ආ. බෞ.ස. ගරු උපදේශක) |
| - | සේනක විමලතුංග මහතා | ව්‍යාපෘති භාණ්ඩාගාරික.<br>( ආ.ආ. බෞ.ස. ගරු උපදේශක) |
| - | මිහිර පෙරේරා මහතා | ( ආ.ආ. බෞ.ස. ගරු අනුශාසක) |
| - | පානි රන්වල මහතා | ( ආදි ශිෂ්‍ය සංගමයේ ගරු සමලේකම්, ආ.ආ බෞ.ස. ගරු උපදේශක) |
| - | අශෝක කරුණාරත්න මහතා | ( ආදි ශිෂ්‍ය සංගමයේ ගරු භාණ්ඩාගාරික) |
| - | අනුර ඒදිරිසිංහ මහතා | ( ආදි ශිෂ්‍ය සංගමයේ ගරු උප සභාපති, විද්‍යාලයීය යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ ආදි ශිෂ්‍ය සංගමයේ අනු කමිටු සභාපති) |
| - | රුවන් රත්නවීර මහතා | ( ආ.ආ. බෞ.ස. ගරු උපදේශක) |
| - | ධනංජය මොහොට්ටි මහතා | ( ආ.ආ. බෞ.ස. ගරු උපදේශක) |
| - | ශාන්ත අල්විස් මහතා | ( ආ.ආ. බෞ.ස. ගරු සභාපති) |
| - | නිශාන්ත රන්දෙනිය මහතා | ( ආ.ආ. බෞ.ස. ගරු ලේකම් ) |
| - | අනූජ ජයසිංහ මහතා | ( ආ.ආ. බෞ.ස. උප සභාපති) |
| - | අජිත් ජයසිරිවර්ධන මහතා | ( ආ.ආ. බෞ.ස. අභ්‍යන්තර විගණක) |
| - | තිලක් අබේවර්ධන මහතා | ( ආ.ආ. බෞ.ස. විධායක සභික) |
| - | ඉන්දික වන්නි ආරච්චි මහතා | ( ආ.ආ. බෞ.ස. විධායක සභික) |

# තාක්ෂණික කමිටුව

| | | |
|---|---|---|
| **ව්‍යාපෘති පරිපාලනය** | චිත්‍රාල් පණ්ඩිත මහතා | Mr. Chitral Panditha. – Civil Engineer<br>B.Sc Eng ( Hons) S.L. B.Mus Hons (Lucknow)<br>M.Sc Constr( L'botouhg). C.Eng. MIE (SL)<br>Managing Director.<br>Project Managemnt & Engineering<br>Consultants (Pvt) Ltd. |
| | මිහිර පෙරේරා මහතා | Mr. Mihira Perera<br>proprietor.<br>Pramith Constructions. |
| **ගෘහ නිර්මාණ සැලසුම්** | ධනංජය මොහොට්ටි මහතා | Mr. Dhananja Mohotti – Co ordinator<br>Sujith Mohotti Associates pvt Ltd |
| | කපිල සුගතදාස මහතා | Mr. Kapila Sugathadasa - Architect<br>B.Sc ( BE ) . |
| **සිවිල් ඉංජිනේරු සැලසුම්** | ආනන්ද සෙනරත් මහතා | Mr. Ananda Senarath. – Structural Engineer<br>B.Sc Eng M.Sc Eng. MIE ( SL)<br>Director.<br>Stems Consulatants ( Pte ) Ltd. |
| **විදුලි පරිපත සැලසුම්** | ඉන්දික වන්නිආරච්චි මහතා | Mr. Indika Wanniarachchi – Electrical Engineer<br>BSc. Eng. (Hons) , CEng. MIE(SL), MIET( UK)<br>Electrical Engineer<br>Central Bank Of Sri Lanka |
| **ප්‍රමාණ සමීක්ෂණ වාර්ථා** | මහේන්ද්‍ර ජයසිංහ මහතා | Mr. Mahendra Jayasinghe – Quantity Surveyor<br>AMSST ( Lond ). RM.IQSSL<br>Managing Partner.<br>MND Associates |
| **වාතාශ්‍ර පරිපාලන සැලසුම්** | කැළුම් පෙරේරා මහතා | Mr. Kalum Perera – Mechanical Engineer<br>BSc. Eng. , CEng. MIE(SL), Pg.Dip (Bldg. Serv.)<br>Pg.Dip ( B.M ) |

# අරමුදල් පරිපාලනය

මූල්‍ය හා ආවසරික ගණකාධිකාරිවරයෙකු වන සේනක විමලතුංග L.I.C.A.(S.L), AFA (Lond), MAAT(S.L) මහතාගේ සහ ආදි ආනන්දීය බෞද්ධ සංගමයේ වත්මන් අභ්‍යන්තර විගණක අජිත් ජයසිරිවර්ධන මහතාගේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් පිහිටුවන ලබන පරිපාලන ලේකම් කාර්යාලය මගින් සියළු අරමුදල් පරිපාලනය කෙරෙන අතර, සියළුම මූල්‍යමය කටයුතු ආනන්ද විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ පූර්ණ අධීක්ෂණයට යටත්ව, " **ආනන්ද විද්‍යාලයීය සංවර්ධන අරමුදල** " ( **ANANDA COLLEGE DEVELOPMENT FUND** ) යටතේ ලංකා බැංකුවේ මරදාන ශාඛාවේ අංක 371994 දරණ ගිණුම තුළින් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

**දරු පරපුර සාරධර්මයන්ගෙන් සපිරිණු ශ්‍රේෂ්ඨ පුරවැසියන් බවට පත් කිරීම සඳහාත්**
**දෙලොව සැනසීම ලබාදීම සඳහාත් හේතුවන**
**මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ඔබ සැමගෙන් ලැබෙන සහය අප අගේ කොට සලකන අතර,**
**තවදුරටත් පහත දැක්වෙන පරිදි ඔබගේ සහායයන්ට අපගේ කෘතවේදීත්වය පළ කරන්නට**
**කටයුතු යොදා ඇති බවද සිහිපත් කරමු.**

රු.1,000,000/= හෝ ඊට වැඩි ආධාරයක් සඳහා

- විහාර මන්දිරයේ සවිකෙරෙණ සිහිවටන ඵලකයකයෙහි නම ඇතුලත් කිරීම.

රු.500,000/= හෝ ඊට වැඩි ආධාරයක් සඳහා

- සිහිවටන ඵලකයක් ( type 1 ) ලබා දීම

රු.100,000/= හෝ ඊට වැඩි ආධාරයක් සඳහා

- සිහිවටන ඵලකයක් ( type 2 ) ලබා දීම

රු.50,000/= හෝ ඊට වැඩි ආධාරයක් සඳහා

- සිහිවටන ඵලකයක් ( type 3 ) ලබා දීම

**වත්මන් ආනන්දීය දරුවන් ගෙන් ලැබෙන රු.1,000/= ක් හෝ ඊට වැඩි ආධාරයක් සඳහා**

- ලැමිනේට් කරන ලද ආනන්ද පිළිම වහන්සේගේ දර්ශනීය ඡායාරූපයක් ලබා දීම

ආනන්ද විහාර මන්දිරය පිළිබඳ සියළු විස්තර ඇතුලත් සකස් කරන සඟරාවට ආධාර ලබා දෙන සියළුම පරිත්‍යාගශීලීන්ගේ නම් ඇතුලත් කිරීමටද තිරණය කරන ලදී.

**ඔබගේ ආධාර මුදලින් හෝ " ආනන්ද විද්‍යාලයීය සංවර්ධන අරමුදල "** ( ANANDA COLLEGE DEVELOPMENT FUND ) **නමින් රේඛනය කරන ලද චෙක්පතක් මගින් හෝ ලංකා බැංකුවේ මරදාන ශාඛාවේ අංක 371994 ගිණුමට බැර කිරීමෙන් හෝ ලබා දිය හැක.**

ඔබ ලබා දෙන සෑම ආධාරයකටම රිසිට් පතක් නිකුත් කරණ අතර ඔබ විසින් ගිණුමට බැර කරනු ලබන ආධාර සඳහා අදාල බැංකු ලදුපත අපවෙත ලබාදුන් පසු රිසිට් පත නිකුත් කරනු ලැබේ. ඔබ විසින් ලබා දෙන **සියළුම ආධාර ආදායම් බද්දෙන් නිදහස් කෙරේ.**

# ප්‍රතිසංස්කරණ සහ නවීකරණ කටයුතු පැවරීම

මූලික සුදුසුකම් පරීක්ෂාකර තෝරාගත් කොන්ත්‍රාත් සමාගම් අවම වශයෙන් 3ක් හෝ ඊට වැඩි ප්‍රමාණයකින් ICTAD ආයතනය මගින් සම්මත ක්‍රමවේදයන්ට අනුව ටෙන්ඩර් පත් කැඳවා, සියළු ටෙන්ඩර්පත් පිරිඇගයීමකට ලක් කොට තාක්ෂණික සහ ක්‍රියාකාරී කමිටුවේ අනුමැතිය ඇතිව සියළු සුදුසුකම් සපුරන පිලිගත් කොන්ත්‍රාත් සමාගමක් තුලින් විහාර ප්‍රතිසංස්කරණ සහ නවීකරණ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ.

මෙහිදී ආදි ආනන්දීයන්ට අයත් හෝ ඔවුන් පාලනය කරනු ලබන ගොඩනැගිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ පිලිගත් ආයතන කෙරෙහි අපි වැඩි බලාපොරොත්තුවක් ඇති කරගන්නා අතර, ඔවුන්ගෙන් මේ සඳහා තරගකාරි මිල ගනන් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරන්නෙමු.

# ව්‍යාපෘතිය සම්බන්ධ වැඩි විස්තර සඳහා


මිහිර පෙරේරා මහතා

දුරකථන - 0777 303 583
e-mail - pereramihira@gmail.com

සේනක විමලතුඟ මහතා

දුරකථන - 0771 059 627
e-mail - sgwimalatunga@gmail.com

මහේන්ද්‍ර ජයසිංහ මහතා

දුරකථන - 0777 388 573
e-mail – mahenja@yahoo.com or mndasso@gmail.com

ධනංජය මොහොට්ටි මහතා

දුරකථන - 0777 317 009, 0714 952 804
e-mail - dhananjayamohotti@gmail.com

# ඉලක්කගත කාලය

| | කාර්යය | ආරම්භක දිනය | සම්පූර්ණ කරන දිනය | ජුලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝම්බර් |
|---|---|---|---|---|---|---|---|
| 1. | අරමුදල් රැස්කිරීම ආරම්භය | 1-Jul | - | | | | |
| 2. | මූලික කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් රැස්කර ගැනීම | 1-Jul | 10-Aug | | | | |
| 3. | ටෙන්ඩර් කැඳවීම | 8-Jul | 29-Jul | | | | |
| 4. | පිරිඇගයීම් වාර්ථාව සකස් කිරීම | 30-Jul | 5-Aug | | | | |
| 5. | තාක්ෂණික කමිටුවේ සහ ක්‍රියාකාරී කමිටුවේ අනුමැතිය ලබා ගැනීම | 5-Aug | 13-Aug | | | | |
| 6. | ව්‍යාපෘති කොන්ත්‍රත්තුව තොරාගත් ආයතනයට පිරිනැමීම සහ ගිවිසම් අත්සන් තැබීම | 15-Aug | | | | | |
| 7. | විහාර මන්දිරය තුළ පවත්වන විශේෂ සෙත් පිරිත් දේශනයක් සහ බුද්ධ පූජා පිංකම | 19-Aug | | | | | |
| 8. | විහාර මන්දිරය තුල සංරක්ෂණ සහ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම | 20-Aug | 29-Oct | | | | |
| 9. | කොන්ත්‍රාත් සමාගමෙන් විහාර මන්දිරය භාර ගැනීම | 30-Oct | | | | | |
| 10. | පිරිත් දේශනය සහ විහාර මන්දිරය විද්‍යාලයට භාරදීම | 31-Oct | | | | | |

# ආනන්දය විහාර වංශ කථාව..

කොළඹ ආනන්ද විද්‍යාලයීය සදා වන්දනීය වූ සුධවල විහාර මන්දිරයත්, එහි තැන්පත් කොට පිහිටුවා වදාළ ශ්වේත වර්ණ බුද්ධ ප්‍රතිමා වහන්සේත් නූතන බුදු සසුනෙහි, සමකාලීන බෞද්ධ සංස්කෘතික උරුමයෙහි අමිල අනගි ප්‍රතිමූර්තියකි.

බොදු හැදියාවේ මුදුන් මල්කඩ හැටියට සැලැකෙන ආනන්ද විද්‍යාලය ඔබේත්, මගේත්, අප රටේත් අග්‍රගණ්‍ය පාඨශාලාවකි. මහරු ඉතිහාසයකින් පිරිපුන් මෙම වටිනා විද්‍යාස්ථානය, පුණ්‍යනිකේතනය ගොඩ නංවා ඇත්තේ පොදු ජනතාවගේත්, කුඩා හා මහා දානපතියන්, වරින් වර මෙරට පාලනයකළ රජයන් ඇතුළු බොහෝ දෙනාත් දුන් අතහිත, පරිත්‍යාග ඇපකැපවීම් මධ්‍යයේත් පියවරෙන් පියවරය. එම පාසලෙන් සිප් සතර හදාළ සිසු කැළ විසින් පසු කලෙක මහා වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, ගණකාධිකාරීවරුන්, විද්‍යාඥයන්, කළමනාකරුවන්, ව්‍යාපාරිකයන්, ගුරු,ආචාර්ය මහාචාර්යවරුන්, සුචරිතවත් දේශපාලනඥයින් මෙන්ම වටිනා රටවැසියන් ලෙස අප රටටත්, ලෝකයේ හතර දිග්භාගයේ වෙනත් රටවලටත් මහා සේවයක් කරමින් පවතී.

1815 උඩරට ගිවිසුමෙන් බ්‍රිතාන්‍යයන් සටකපටකමින් පවරාගත් ධර්මද්වීපය නම් විරුදාවලිය ලත් අපේ මාතෘභූමිය 2015 වනවිට අපේ සෙවරීභාවය අහිමිවීමෙන් වසර දෙසීයක් සපුරනු ලැබේ. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී යුගයේ මිෂනාරී අධ්‍යාපනය පතුරුවා සමාජ සංස්කෘතික ආක්‍රමණයක් සිදුකරමින් සිටියදී බුදුසමය ඇසුරෙන් සත්පුරුෂ, සදාචාර සම්පන්න, විනීත, ආචාරශීලී ගුණනුවණ ඇති ප්‍රඥා සම්පන්න දරු පරපුරක් බිහිකොට බෞද්ධ පුනර්ජීවයක් නැංවීම උදෙසා ඉමහත් පරිශ්‍රමයෙන් ආරම්භ කළ බෞද්ධ විද්‍යාලය ආනන්දයයි. දරුවන් වෙතින් අපේක්ෂා කළ එම උත්තම පරමාර්ථය සම්පූර්ණ කිරීමට විහාර මන්දිරයකින් ලබාගත හැකි ප්‍රතිඵල සුවිශාලය.

1886 මැලිබන් වීදියේ අංක 61 දරන ස්ථානයේ පිටකොටුවේ බෞද්ධ ඉංග්‍රීසි පාඨශාලාව පසුව ආනන්ද විද්‍යාලය නම් වූයේ මිගොට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ධර්ම භාණ්ඩාගාරික ආනන්ද හිමියන්ගේ නම යෝජනා කිරීමෙන් පසුවයි. මුල් කාලයේ සිටම ආනන්දයට බුදුමැදුරක් වුවමනා වූයේය. ශ්‍රේෂ්ඨතම විදුහල්පතිවරයෙකුවූ පී.ද ඇස් කුලරත්න මහත්මාගේ කාලයේදී එදා කාලයට හා තත්වයට අනුරූපව එම අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු සිදුවිය. එසමයෙහි ආනන්දයේ ධර්මාචාර්ය ධුරය දරමින් අනල්ප සේවාවක් ඉටුකළ අති පූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රීය මහා නායක ස්වාමීන් වහන්සේගේ අප්‍රතිහත ධෛර්යය කරණ කොට 1929 ජුලි මස 10වන දින ඇරඹු විහාර මන්දිරය පිහිටා තිබුනේ දුටුගැමුණු ගොඩනැගිල්ල අසල පැවති හරිස්චන්ද්‍ර ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ පිළියෙළ කොටගත් කුටියකය ( මෙම ගොඩනැගිලි දැනට නැත).

ආනන්දයේ ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවීමත්, බෞද්ධ වත්පිළිවෙත් වැනි විවිධ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීමත් සමග සුවිසල් විහාර මන්දිරයක අවශ්‍යතාව වඩාත් දැනෙන්නට විය. එහි ප්‍රතිඵලයක් හැටියටත්, එවකට විදුහල්පතිත්වය දැරූ ඇල්. එච්. මෙත්තානන්ද මහත්මාගේ ආරාධනයෙන් ඩඩ්ලි සේනානායක අගමැතිතුමා විසින් 1953 ජනවාරි මස 29 දා නව විහාර මන්දිරයක් ගොඩ නැංවීම පිණිස මුල්ගල තැබිණි. එය සාර්ථකව නිමකිරීම පිණිස බෞද්ධ දානපති වෛද්‍ය ඊ. එම්. විජේරාම මහත්මා සහ අනුලා විජේරාම මහත්මිය රු. 25,000.00 බැගින්, කොල්ලුපිටියේ ප්‍රසිද්ධ ව්‍යාපාරික පරිත්‍යාගශීලී ඒ.බී. හේමචන්ද්‍ර මහත්මා රු. 20,000.00 බැගින් වශයෙන් සෑහෙන පිරිසකගේ නොමසුරු කාරුණික සහය අනුග්‍රාහශීලිත්වය එදා ලැබී තිබුනු බැව් සඳහන් වේ.

“විහාර කාර්ය සාධක ”සමිතියක් පිහිටුවාගෙන එකල විහාර මන්දිරයේ වැඩ කටයුතු සිදු කර ඇත. ඉන්දියාවේ බරණැස ඉසිපතන මිගදායේ සාරානාත්හි අනගාරික ධර්මපාලතුමා විසින් ඉදිකරවන ලද මූලගන්ධකුටි විහාර මන්දිරයේ ආකෘතියට අනුරූපව ආනන්ද විහාර මන්දිරය ඉදිකරවන ලදී. එහි ප්‍රතිෂ්ඨාපිත කලාසූරී පූජ්‍ය මාපලගම විපුලසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් නිර්මාණය කොට සුදෝ සුදින් දිදුළන සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේ දහස් සංඛ්‍යාත ආනන්දීයයන්ට පමණක් නොව මුලු සිරිලකටම ශාන්තිය, සැනසීම උදාකරන උත්තරීතර සැදැහැගුණ නුවණ පතුරුවාලීම ඉමහත් භාග්‍යයකි. දැනට ලොව පවතින සර්වඥ ධාතූන් වහන්සේ තැන්පත් කොට පවතින

දර්ශනීය වූ දුර්ලභ බුද්ධ ප්‍රතිමාවන්ගෙන් එකක් වශයෙන් මේ ප්‍රතිමාව සලකනු ලැබේ. මෙම විහාර මන්දිරය 1969 මාර්තු 06 වන්දින ඊ. ඒ. පේරුසිංහ විදුහල්පතිතුමාගේ ආරාධනයෙන් හිටපු ආණ්ඩුකාර විලියම් ගොපල්ලව මැතිතුමා විසින් විවෘත කිරීමත් සමග ආනන්දයේ උතුම් සදහම් සංකේතය බවට මූර්තිමත් වූයේය.

බ්‍රහ්මචාරී හරිස්චන්ද්‍ර ගොඩනැගිල්ලේ දශක හතරක පමණ කාලයක් මහත් පූජාවන්ට ලක්වෙමින් වැඩ සිටි ටිබෙට් ජාතික ඇස්. මහින්ද හිමියන් විසින් ආනන්ද විද්‍යාලයට ඉන්දියාවෙන් වැඩමවන ලද බුද්ධ ප්‍රතිමාව පසුව ශිෂ්‍ය නේවාසිකාගාරයේ උඩුමහලේ පසෙක තැන්පත් කොට පැවතුණි. ආනන්දය සදානුස්මරණීය ආනන්දයක් බවට පත් කරමින් අග්‍රගණ්‍ය මෙහෙවරක් ඉටුකළ හිටපු විදුහල්පති සෙන්පති පී. ඩබ්ලිව් රාජපක්ෂ මැතිතුමා විසින් විද්‍යාලයීය බෞද්ධ සංගමයේ ද කැමැත්ත ඇතුව ප්‍රතිමාව මාතර පාලටුවේ ගුණරත්න මහා විද්‍යාලයට පරිත්‍යාග කරණ ලදී. දැනට එහි ඉදිකොට ඇති විහාර මන්දිරයෙහි තැන්පත් කොට ඇත්තේ මේ ඓතිහාසික බුද්ධ ප්‍රතිමා වහන්සේය.

ආනන්දයේ අභිනව විහාර මන්දිරය 1969 දී විවෘත කළ නමුත් දස වසරක් පමණ කාලයක් ගතවත්ම කොන්ක්‍රීට් වහලයෙන් ජලය කාන්දුවීමට පටන් ගැනීමෙන් සැම දෙනාම පසුවූයේ ඉමහත් වේදනාවෙනි. කනස්සල්ලෙනි. අපහසුවෙනි. විවිධ අයගේ සහය ලබාගෙන විදුහල්පතිතුමා හා බෞද්ධ සංගමයේ අනුශාසක ස්වාමීන් වහන්සේලා මැදිහත්ව වාර ගණනක් කළ ප්‍රත්සංස්කරණයන් දිගුකාලීන නොවීය. එයට ප්‍රධාන හේතුවක් වූයේ යාබද ප්‍රධාන මාර්ගයේ අඩදක වාහන ගමනා ගමනයයි.

අති පූජ්‍ය දිවියාගහ යසස්සී නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ මෙහෙයවීමෙන් ආදි ආනන්දීය බෞද්ධ සංගමය 1988 දී ආරම්භ කොට විවිධ සේවාවන් විද්‍යාලයතුල හා බැහැරත් සිදුකරමින් පැවතුණි. ඒ අතර විද්‍යාලයීය විහාර මන්දිරයේ දුක්බදායක තත්වය කෙරෙහි දැඩි අවධානය යොමු කොට එය සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කළේ එවකට එම සංගමයේ සභාපතිත්වය දැරූ රුහුණු කතරගම මහා දේවාලයේ බස්නායක නිළමේ තැන්පත් යසසිරි කස්තුරි ආරච්චි මහත්මා රුපියල් 2,300,000.00ක් පමණ වූ ප්‍රතිසංස්කරණයට අවශ්‍ය මුළු මුදලම පරිත්‍යාග කිරීමෙනි. නවීකෘත ආනන්ද විහාර මන්දිරයතුල සම්බුදුරදුන් ප්‍රථම පුෂ්පෝපහාරයේදී අතිපූජ්‍ය අග්ගමහා පන්ඩිත බලන්ගොඩ ආනන්ද මෛත්‍රිය මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රධාන සැදැහැවතුන්ට සුවඳ මලින් පුදදීමේ වාසනාව හිමිවිය.

විහාර මන්දිරයතුල සිදුකරන ලද මෙම ප්‍රතිසංස්කරණයන්ගෙන් පසුව විහාර මන්දිරයේ පිටත කොටස ද මේ ආකාරයෙන්ම ජල කාන්දුවීමට පටන් ගත් අතර ආදි ආනන්දීය එංගලන්ත ශාඛාවේ කාරුණික අනුග්‍රහයෙන් රුපියල් 2,500,000.00 පමණ වැය කොට විහාර මන්දිරයේ පිටත කොටසේ ජල කාන්දුවට පිළියම් යොදමින් නැවත වතාවක් ආනන්ද විහාර සංකීර්ණය ප්‍රතිසංස්කරණය කරන ලදී.

ආනන්ද විහාර මන්දිරයේ චිරකාලීන පැවැත්ම බලවත් අර්බුදයකට, අනතුරකට පත්ව ඇති කනගාටුදායක අවස්ථාවක එහි ඉතිහාසය, වර්තමාන අභියෝග ගැටළු හා එම ප්‍රශ්න වලට පිළියම් කිරීමෙහි ඇති වැදගත් කටයුත්ත ඔබටද පැහැදිලි කරදීමද ඊට සහභාගීකරවා ගැනීම අවශ්‍යයැයි අපි කල්පනා කළෙමු. එමනිසා ඔබගේ වටිනා කාලයෙන් මද වේලාවක් ඊට කැපකොට එම සත්කාර්යය සාර්ථක කර ගැනීමට සහයෝගය දැක්වීම වෙනුවෙන් තුති පළකරන අතර, යෝජිත ප්‍රතිසංස්කරණ කටයුතු සාර්ථක කරගැනීමට අප හා එකාවන්ව බැඳී සහෝදරත්වයෙන් එකතු වන මෙන් කාරුණිකව ආරාධනා කරමු.

- මහාචාර්යය ප්‍රනීත් අබේසුන්දර
ගරු උපදේශක
ආදි ආන්දීය බෞද්ධ සංගමය

# ආදි ආනන්දීය බෞද්ධ සංගමයේ වසර විසි පහක සේවාවන් .

- සංගමයේ ආරම්භය 1988 මැයි මස 22 වන දින ආනන්ද විද්‍යාලයීය කුලරත්න ශාලවේදී ගරු විදුහල්පති ඒ.පී.ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරන ලදී.

- සංගමයේ සභාපතිවරු
  - විශේෂඥ වෛද්‍ය ධම්මික ජයවික්‍රම මහතා
  - මහාචාර්ය අතුල කළුආරච්චි මහතා
  - ජගත් සුමතිපාල මහතා
  - මිහිර පෙරේරා
  - යසසිරි කස්තුරිආරච්චි මහතා
  - කුෂිල් ගුණසේකර මහතා
  - කර්නල් සුදත් මඩුගල්ල මහතා
  - චන්න පලන්සූරිය මහතා
  - රුවන් රත්නවීර මහතා
  - සේනක විමලතුංග මහතා
  - පානි රන්වල මහතා
  - මහේන්ද්‍ර ජයසිංහ මහතා
  - ශාන්ත අල්විස් මහතා ( වත්මන් සභාපති )

- ආනන්ද විහාර මන්දිරය
  - දිනපතා විහාර මන්දිරය නඩත්තුව
  - විහාර මන්දිරයට විදුලි පංකා සවිකිරීම
  - විහාර මන්දිරයේ පිටත කොටස නවීකරණය කිරීම
  - විහාර මන්දිරයේ පිටත කොටසේ ජල කාන්දුව වලක්වීම සඳහා පිලියම් යෙදමින් නැවත ප්‍රති සංස් කරණය කිරීම
  - විහාර මන්දිරයට විදුලි බලයෙන් ක්‍රියා කරන වීදුරු දොරක් සවි කිරීම

- දාන පාරමී ශිෂ්‍යාධාර වැඩසටහන
  - උගත්කම සහ බුද්ධිමත් කම තුලින් සමාජය ජය ගන්නට අතිශය දුෂ්කර වූ ගමන් මගක යෙදෙන ආර්ථික වශයෙන් උපකාර අවශ්‍ය ආනන්ද මාතාවගේ තුරුලේ හැදී වැඩෙන තොරාගත් ආනන්දීයයනට දිරිය ශක්තිය ලබාදීමේ අධිෂ්ඨානයෙන් මාසිකව ලබා දෙන ශිෂ්‍යාධාර ව්‍යාපෘතියකි
  - තෝරාගත් ආනන්දීයන් සඳාහා දිනපතා උදෑසන ආහාර වේල ලබාදීම .
(ඉතාමත් රහසිගතව සිදුකරන ව්‍යාපෘතියකි.)
  - තෝරාගත් ආනන්දීයන් සඳහා වාර්ෂිකව පොත් පත් සහ උපකරණ කට්ටල ලබා දීම .

- බුද්ධ ධර්මය පිලිබඳ වාර්ෂික ශිෂ්‍යත්ව
  - විද්‍යාලයේ ජ්‍යේෂ්ඨ අංශයේ සෑම ශ්‍රේණියකම බුද්ධ ධර්මය විෂය වෙනුවෙන් වැඩිම ලකුණු ලබා ගන්නා දරුවන් වෙනුවෙන් පිරිනමන ශිෂ්‍යත්ව සඳහා අනුග්‍රහකත්වය ලබා දෙන්නේද අප සංගමයයි

- විරපුත්‍රභිනන්දනී ශිෂ්‍යාධාර වැඩසටහන
  - දිවයිනේ ප්‍රථම වතාවට පාසලක් මගින් රණවිරු දරුවන් සඳහා ශිෂ්‍යාධාර ලබාදීමේ වැඩපිළිවෙල ආරම්භ කිරීමට අපට හැකි විය. ආනන්ද මාතාවගේ තුරුලේ හැදී වැඩෙන මියගිය රණවිරුවන්ගේ දරුවන් වෙනුවෙන් මාසිකව ලබා දෙන මෙම ශිෂ්‍යාධාරය එම දරුවන් ආනන්දයේ ඉගෙනුම ලබා අවසන් වනතුරුම ක්‍රියාත්මක කෙරෙණු ඇත.

- අනුස්මරණ ශිෂ්‍යත්ව
  - අනුග්‍රාහකයන් මගින් සංගමය තුල පවත්වගෙන යනු ලබන ස්ථිර තැන්පතු මගින් ලබෙන මාසික පොලියෙන් තෝරාගත් දරුවන් වෙනුවෙන් ස්ථිර ශිෂ්‍යත්ව ප්‍රධානයක් සිදුකරනු ලැබේ.

- ධම්මික ජයවික්‍රම අනුස්මරන ත්‍යාගය
  - අප සංගමයේ ආරම්භක සභාපතිවරයා වන අභාවප්‍රාප්ත විශේෂඥ වෛද්‍ය ධම්මික ජයවික්‍රම මහතාට උපහාරයක් වශයෙන් ආනන්ද විද්‍යාලයෙන් වෛද්‍ය විද්‍යාලයට ඇතුල්වන දක්‍ෂතම ශිෂ්‍යායට සංගමය විසිපස් සැපිරූ පසුගිය වසරේ සිට ඉදිරියට සැම වසරකම ලබා දෙනු ලබන ත්‍යාගයකි.

- වාර්ෂික සුහද හමුව
  - මත් වතුරින් සහ දුම්වැටියෙන් තොරව දේශිය සංස්කෘතික අංගයන් සමගින් අපේ කම මුල් කරගෙන ඉතාමත් සාර්ථකව සැම වසරකම සංවිධානය කරනු ලබන පවුලේ එකතුව.

- දිළිඳු ගම්මාන නගා සිටුවීමේ ව්‍යාපති
  - අනුරාධපුර, කුඩාගම, සිප්පිකුලම ගෝනපැටියාව ගම්මානය
  - ගෝනපැටියාව විදුහල සංවර්ධනය කිරීම
  - සේරුවිල මහින්දපුර ගම්මානයේ සහ විහාරස්ථානය සංවර්ධනය කිරීම
  - මොණරාගල, මාලිගාවිල නියදැල්ල ගම්මානය සංවර්ධනය කිරීම
  - හම්බන්තොට බෙරලිගල ග්‍රාමයේ පවුල් 29 ක් සඳහා පානීය ජලය ලබාදීම
  - එවකට ඉතාමත් නොදියුණු තත්වයේ පැවති හම්බන්තොට දිස්ත්‍රික්කයේ රෝහල් සඳහා මදුරු දැල් ලබා දීම
  - පුංචි වැව ග්‍රාමය නගාසිටුවීම
  - වගා ලිං ලබා දීම
  - මරණයෙන් බේරාගත් ගවයින් ලබා දෙමින් ගම්වාසීන්ගේ ආදායම් මාර්ගය වැඩිදියුණු කරගැනීමට අත්වැලක් සපයීම.
  - බෝග වගාවන් සඳහා බීජ පැල , කෘෂි උපකරන සහ ආම්පන්න ලබා දීම
  - වෛද්‍ය සායන පවත්වා ප්‍රතිකාර අවශ්‍ය සැමට වෛද්‍යය ප්‍රතිකාර පමණක් නොව වෛද්‍යය පර්යේෂණ කටයුතු ලබා දීම
  - එවකට මායිම් ගම්මාන ලෙස ප්‍රකට ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කන්තලේ අල්ල ප්‍රදේශයේ සමගිපුර, සමනල පාලම සහ සුරියපුර ගම්මාන වෙනුවෙන් වෛද්‍ය සායනය, දන්ත සායනය සහ අක්ෂි සායනය පැවැත්වීම
  - කන්තලේ සහ සේරුවිල අවට ප්‍රදේශවල විහාරස්ථාන වලට අවශ්‍ය උපකරණ ලබාදීම සහ දහම් පාසල දරුවන් සඳහා දහම් පාසල් නිල ඇඳුම් සහ පොත් පත් ප්‍රදානය කිරීම

- සුනාමි ව්‍යසනයෙන් පීඩාවටපත් ගම්මාන නගා සිටුවීම
  - සුනාමි ව්‍යසනයෙන් අසරණව නැගෙණහිර ප්‍රදේශයේ තනිව වෙනත් ජාතීන්ගේ උකුස ඇසට යොමුව අසරණ වූ උල්ල ගම්මානයේ සිංහල සහ දමිල ජනතාව ගිල ගන්නට මාන බැලූ අවස්ථාවේ නොබියව මුහුණදී උල්ල ගම්මානයත් එම ප්‍රදේශයේ ඇති එකම සිංහල විද්‍යාලය වූ උල්ල සිංහපුර සිංහල විද්‍යාලයත් ආරක්ෂා කරගන්නට අපට හැකි විය. සියළුම ගොඩනැගිලි බිමට සමතලා වී බුදු මැදුර පමනක් ඉතිරිව තිබූ උල්ල සිංහල විද්‍යාලය ප්‍රදේශයේ පාලකයන් විසින් වසා දැමීමට සූදානම් වූ මොහොතක ඉදිරිපත් වී නැවත ගොඩනැගූ උල්ල සිංහපුර සිංහල විද්‍යාලය අද වනවිට මහල් ගොඩනැගිලි වලින් සමන්විත ව ප්‍රදේශයේ එකම සිංහල පාසල ලෙසින් සාර්ථකව පවත්වාගෙන යනු ලබයි

- නිසට සෙවනක් ලබාදීම
  - සුවකළ නොහැකි යැයි පැවසූ රෝගයකින් පෙළෙන ආදී ආනන්දීයයෙකු වෙනුවෙන් කාමර 3 කින් සමන්විත අංග සම්පූර්ණ නිවසක් ලබා දීම. ( සුවකළ නොහැකි යැයි පවසා ප්‍රතිකාර නතර කර නැගිට සිටීමටවත් නොහැකිව සිටි ආදි ආනනදීය සොයුරාට අපගේ විශේෂඥ වෛද්‍යය වරුන්ගේ නොපසුබට උත්සාහය තුලින් අදවන විට තමන්ගේ සියළුම කාර්යයන් තනිව කරගෙන යා හැකි තත්වයට සුවපත් කරන්නට හැකිව ඇත).
  - නිකවැරටිය ප්‍රදේශයේ දිළිඳු පවුලක් වෙනුවෙන් නිසට සෙවනක් ලබා දෙන්නට අපට හැකිවිය2600 වන සම්බුද්ධත්ව
  - 2600 වන සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් දිවයිනේ පාසල වල පවත්වන ලද සම්බුද්ධත්ව ජයන්ති උළලේ ආරම්භක උත්සවය ආනන්ද විද්‍යාලයේදී සංවිධානය කිරීම
  - පාසල් දරු දැරියන්ගේ සහභාගිත්වයෙන් සම්බුද්ධත්ව ජයන්ති පෙරහැර ප්‍රථම වතාවට සංවිධානය කිරීම

- 2600සම්බුද්ධත්ව ජයන්තිය
  - 2600 වන සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් දිවයිනේ පාසල වල පවත්වන ලද සම්බුද්ධත්ව ජයන්ති උළලේ ආරම්භක උත්සවය ආනන්ද විද්‍යාලයේදී සංවිධානය කිරීම
  - පාසල් දරු දැරියන්ගේ සහභාගිත්වයෙන් සම්බුද්ධත්ව ජයන්ති පෙරහැර ප්‍රථම වතාවට සංවිධානය කිරීම

- ආරොග්‍යශාලා පුස්තකාල සේවාව
  - ආරොග්‍යශාලාවල නේවාසිකව ප්‍රතිකාර ලබන අයගේ සහ ඔවුන්ගේ උපස්ථානයන්ට රැඳී සිටින අයගේ ප්‍රයෝජනය සඳහා ඔවුන්ගේ මානසික සුවය ඇතිකරලීමේ අදිටනින් ආරෝග්‍යශාලාවල තෝරාගත් වට්ටුවල ආරම්භ කළ අනඳ පොත්ගුල ව්‍යාපෘතිය

- සදාචාරාත්මක සමාජයක් සඳහා සමාජ ගුණධර්ම වර්ධනය කිරීමේ අටියෙන් විවිධ වූ සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවිධානය කිරීම,

- සාරධර්ම සුරකිමු තේමාව යටතේ අප විසින් පා ගමනකින් ආරම්භ කරන ලද වැඩ සටහන දුම්රිය දෙපාර්තමේන්තුවේ බෞද්ධ සංගමයේ ද සහය ඇතිව දිවයින පුරා දුම්රිය ස්ථාන දුම් නොබන කලාප ලෙස නම් කිරීම

- ආදි කර්තෘ දිනය වෙනුවෙන් එකම දිනකදී දිවයිනේ සහ ලොව පුරා විහාරස්ථාන 150 කට අධික ස්ථානවල ධර්ම දේශනා සංවිධානය කිරීම

- පාසල් 50ක විදුහල්පතිවරුන් සඳහා පවත්වන ලද එක් දින වැඩමුළුව

- ගුරු උපහාර උළෙලවල් සංවිධානය කිරීම

- ජ්‍යෙෂ්ඨ ආදි ආනන්දීයයන්ට උපහාර පිදීම

- ආනන්දයේ ඉගෙණුම ලබන සියළුම දරුවන් වෙනුවෙන් ඉතාමත් වටිනා ආදර්ශ පාඨ සහ වැකි ඇතුලත් දර්ශනීය දින දර්ශනයක් ලබා දීම

ආනන්ද මාතාවට ධෛර්යයක්, ශක්තියක් වන්නට රටට, ජාතියට සේවයක් කරන්නට ආදි ආනන්දීයයන්ගේ ඇත්තාවූ උදාර අධිෂ්ඨානයනට ගරු කරමින් ආදි ආනන්දීය බෞද්ධ සංගමය අද දින උරදී ඇත්තේ අප ශිල්ප උගත් ආනන්ද මාතාවට තවත් යුතුකමක් ඉටු කරලීමටයි. ආනන්දයේ උතුම් සදහම් සංකේතය! ආනන්දයේ අභිමානය!, ආනන්ද මාතාවගේ හදවත ! සුවපත් කරන්නට, නව ජීවයක් ලබා දෙන්නට අප ගන්නා මෙම උත්සාහයට ඔබ සැමගේ සහය අපවෙත ලබා දෙන බව අපගේ දැඩි විශ්වාසයයි.

ආනන්ද විහාර මන්දිරයේ වැඩ සිටිනා සමාධි පිළිම වහන්සේගේ උතුම් වූ බලයෙන් ආනන්ද මාතාවගේ අද්විතීය ගමන් මග තව තවත් ශක්තිමත් වේවා!.

- ආදි ආනන්දීය බෞද්ධ සංගමය